**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----**-------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූලි 24 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**---------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) 2017 මාර්තු මාසයේදී, වෙන්දේසි කරන ලද රු.261,255 ක් වූ යන්ත්‍ර සහ රු.218,370 ක්වූ ලී බඩු වටිනාකම් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි.

(ආ) 2005 වර්ෂයට අදාල මූලධන ආධාර රු.1,033,173 ක් එම වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට බැර කර තිබියදී, නැවත 2015 වර්ෂයේදී ජර්නල් සටහන් අංක 29 මගින් එම මුදල සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
**----------------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.16,674 ක්වූ පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් වටිනාකම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ලිපියකට අනුව රු.420,492 ක් වූයෙන් රු.403,818 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායම අදාල ලේඛන අනුව රු. 4,424,957 ක් වුවද, ඒකාබද්ධ හිඟ ආදායම් වාර්තාව අනුව එම අගය රු. 4,290,574 ක් වූයෙන් රු.134,383 ක වෙනසක් පැවතුණි.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම
**-----------------------------------------**

රු. 83,931 ක් වූ ණයගැතියෝ හා රු. 250,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් උපලේඛන හා ශේෂ සනාථ කිරීම් නොමැතිවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.4 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

**පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | |
| (I) 158 වගන්තිය | සභා බල ප්‍රදේශයේ වරිපනම් නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපළ තහනමට ගෙන රු.7,985,676 ක් වූ හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (II) 159 (1) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදුකුලී රු.4,424,957 ක් සහ කඩකුලී රු.572,550 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ. 371 | 2008, 2009 සහ 2014 වර්ෂවලදී ලබා දී තිබුණු රු.280,000ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,040,231 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,855,078 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු.4,185,153 ක වර්ධනය සඳහා ආදායම් විෂයයන් දෙකක් රු.9,048,627 කින් වැඩිවීමත්, වියදම් විෂයයක් රු.5,467,073 කින් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

---------------------

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රැස්කළ යුතු වරිපනම් හා බදු ආදායමෙන් සියයට 67 ක්ද, අක්කර බදු ආදායමෙන් සියයට 75 ක්ද, ජල බදු ආදායමෙන් සියයට 79 ක්ද, කඩකුලී ආදායමෙන් සියයට 58 ක් සහ බදුකුලී ආදායමෙන් සියයට 36 ක්ද අයවී නොතිබුණි.

**2.3.2 වරිපනම් බදු**

---------------

පහත කරුණු නිරීක්ෂනය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කළ වරිපනම් බදු මුදල වූ රු. 2,674,966 න් වර්ෂය තුළදී රැස් කරගෙන තිබුණේ රු.1,171,734 ක මුදලක් පමණි. එය බිල් කළ මුදලින් සියයට 44 ක් විය.

(ආ) පෙර වර්ෂවල හිඟ වරිපනම් බදුවලින් සමාලෝචිත වර්ෂය තුළ සියයට 29 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,985,675 ක් අයකරගත යුතුව තිබුණි.

**2.3.3 බදු කුලී**

----------

2016 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී රු. 4,424,957 ක් වු අතර ඉන් රු.4,289,602 ක් 2002 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතු බදු කුලී විය.

**2.3.4 වෙනත් ආදායම්**

--------------------

සභාව විසින් කුලියට දී තිබුණු කඩ කාමර 05 කින් 2016 දෙසැම්බර් 31 දින වනවිට ලැබිය යුතු හිඟ කුලිය රු. 572,550 ක් වූ අතර, එම මුදලින් රු. 470,418 ක් අවුරුදු 01 සිට අවුරුදු 10 දක්වා කාල පරාසයක් තුල අයවීමකින් තොරව පැවතුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම්වරයාගෙන් අයවිය යුතුව තිබූ මුද්දර ගාස්තුවල වටිනාකම රු. 31,266,067 ක් වූ අතර, උසාවි දඩ වටිනාකම රු.9,718,559 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) ස්ථාන මාරුවීම් හා සේවය හැර යාම් හේතුවෙන් සේවක ණය රු.149,210 ක් 2008 වර්ෂයට පෙර සිට හිඟව පවතින අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) සභාව විසින් වසර 9 ක් පැරණි තක්සේරුවක් මත සමාලෝචිත වර්ෂය තුළ දී ද වරිපනම් බදු අයකිරීම හේතුවෙන් වරිපනම් බදු අදායම අඩු වී තිබුණි.

(ඇ) විශේෂ දේපළ ලෙස හඳුනාගෙන තිබුණු දේපළ 22 ක් සඳහා නව තක්සේරු වටිනාකම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී මිළදී ගෙන තිබුණු රු. 149,100 ක්වූ සෙවිලි තහඩු 84 ක් අදාල ප්‍රතිලාභීන් වෙත බෙදා දී නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් 06 ක වූ අක්කර 04 රූඩ් 01 පර්චස් 26 ක් සමාලෝචිත වර්ෂය සඳහා බදු දීමට කටයුතු කර නොතිබුණි.

**3.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

ව්‍යාපෘති 35 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.17,082,104 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ව්‍යාපෘති අතරින් ඇස්තමේන්තු මුදල රු.5,333,008 ක් වූ ව්‍යාපෘති 10 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘති 05 ක් සියයට 20 - 75 අතර ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබූ අතර, ව්‍යාපෘති 20 ක කටයුතු වර්ෂය තුල නිම වී තිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බලප්‍රදේශය තුළ දිනකට කසල අපද්‍රව්‍ය ටොන් 04 ක් පමණ රැස්කර බාහිර පාර්ශවයකට අයත් ඉඩමකට බැහැර කිරීම දිගින් දිගටම සිදු කරන තත්ත්වය තුල පාරිසරික ගැටළු ඇතිවිය හැකි අතර, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**3,4 මානව සම්පත් කළමනාකරණය**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාවට අනුව ද්වීතියික සහ ප්‍රාථමික ශ්‍රේණි දෙකෙහි පුරප්පාඩු 17 ක් සහ අතිරික්ත 08 දෙනෙක් විය.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---------------------------------------

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක:-01/2014 හා 2014 පෙබරවාරි 13 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

**පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.**

| | පද්ධතිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | ණයගැතියෝ | දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම සහ අයකර ගැනීම අවිනිශ්චිත ණයගැති ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම |
| (ආ) | ණයහිමියෝ | දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොගැනීම. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | ලැබිය යුතු වරිපනම් බදු, බදු කුලී, කඩ කුලී, මුද්දර ගාස්තු, උසාවි දඩ මුදල් යනාදී ආදායම් විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | සේවක ණය | 2008 වර්ෂයට පෙර සිට අයවිය යුතු ලෙස දැක්වෙන සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඊ) | කසළ කළමනාකරණය | සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසල පරිසරයට හිතකාමී ලෙස බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. |